**පොල්පිතිගම ප්‍රාදේශීය සභාව - 2021**

**-----------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**-----------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

**------------------------------**

පොල්පිතිගම ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිළි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උප වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට පොල්පිතිගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

**------------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන්, ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-----------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව, විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී, වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී ,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති වීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟ හැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේද, යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වා ගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාල සීමාවන් තුළ සහ අදාළ නිති,රීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳව වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ ගොඩනැගිලි සංවර්ධනය සඳහා දරන ලද වියදම් ප්‍රාග්ධනිත නොකිරීම හේතුවෙන් ජංගම නොවන වත්කම් ගිණුම හා ප්‍රාග්ධන යෙදවුමට ආදායම දායකවීමේ ගිණුම රු.14,129,781 අඩුවෙන් පෙන්වා තිබුණි. | ඉදිරි වර්ෂයේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. | ගොඩනැගිලි සංවර්ධන වියදම් ප්‍රාග්ධනිත කළ යුතු වේ. |
| (ආ) | ජංගම නොවන වත්කම් යටතේ භෞතිකව හඳුනා නොගත් රු.569,473 ක් වටිනාකම වූ ඉඩම් හා ගොඩනැගිලි ශේෂයක් හා රු.935,607ක් වූ ලී බඩු උපකරණ ගිණුම්ගත කර තිබුණි. | මෙම වත්කම් නිශ්චිතව හඳුනාගත නොහැකි අතර, එම වටිනාකම් 02 ම කපා හැරීම සඳහා පළාත් පාලන කොමසාරිස්තුමාගෙන් උපදෙස් ලබා ගැනීම සඳහා කටයුතු කරමින් පවතී. | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතු වේ. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ මිලදී ගෙන තිබූ රු.499,315 ක් වටිනා ස්ථාවර වත්කම් 09 ක් ගිණුම්ගත කර නොතිබුණි. | අඩුපාඩු ජ'නල් මඟින් ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. | |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ රු.160,800 ක විගණන ගාස්තු වෙනුවෙන් ගිණුම්වල ප්‍රතිපාදන සලසා නොතිබුණි. | ඉදිරියට විගණන ගාස්තු සඳහා ගිණුම්වල ප්‍රතිපාදන වෙන් කිරීමට කටයුතු කරනු ලැබේ. | |

## 2. මූල්‍ය සමාලෝචනය

---------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.945,831ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.5,656,231ක් විය.

### 2.2 අධිභාර

----------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව වගකිව යුතු අයවලුන්ට එරෙහිව මවිසින් ඉකුත් වර්ෂයන් තුල පැන වූ අධිභාර 04 ක් සඳහා රු.1,283,910 ක මුදලක් අයකර ගැනීමට තිබුණු නමුත් අධිභාරකරුවන් 17 ක් පළාත් පාලන අමාත්‍යාංශය වෙත අභියාචනා කර ඇති අතර, ඔවුන් නිදහස් කිරීමට හෝ අභියාචනාව ප්‍රතික්ෂේප කිරීම සඳහා වාර්තාවක් ඉල්ලා ඇති අතර, එය ක්‍රියාත්මක කරමින් පවතී. | මෙම මුදල ගෙවා නොමැති බවත්, අධිභාරකරුවන් අභියාචනා කර ඇති බවත් දන්වමි. | ඉකුත් වර්ෂ වලට අදාල අධිභාර සහතික සඳහා මුදල් අයකරගත යුතු වේ. |

## 03. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳව කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කල යුතුව තිබුණු කර්තව්‍යන් ඉටු කිරීම පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

### 3.1 අනාර්ථික ගනුදෙනු

------------------------

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | 2016 වර්ෂයේදී පොල්පිතිගම ප්‍රාදේශීය සභාවට පුර නැගුම ව්‍යාපෘතිය මඟින් ලීටර් 2,000 ජල ටැංකි 120 ක් ස්ථාපිත කර ලීටර් 6,200 ධාරිතාවයෙන් යුත් ට්‍රක් බවුසර් 2ක් ලබා දී තිබුණි. මෙම ව්‍යාපෘතිය යටතේ ජල ටැංකි ස්ථාපිත කළද එම ජල ටැංකිවලට ජලය ලබාදීමක් සිදුකර නොතිබුණු අතර | පුර නැඟුම ව්‍යාපෘතිය මඟින් මෙම ටැංකි ස්ථාපිත කර ඇත. මෙම ජල ටැංකි 2017 ජූනි මස ලබා දුන්න ද ජලය බෙදීම සඳහා බවුසර් ටැංකි ලබා දීම, 2021 මැයි 12 වන දින සිදු විය. මේ වනවිට දැදුරු ඔය ජලාශ ව්‍යාපෘතිය මඟින් පානීය ජලය ලබා දීම් සිදු කිරීම ආරම්භ වී තිබීම හේතුවෙන් මෙම ව්‍යාපෘතිය | ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමේ දී සැලසුම් සහගතව කළ යුතු බවත්, ස්ථාපිත ජල ටැංකි ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| | ව්‍යාපෘතිය අසාර්ථක තත්ත්වයේ පැවතුණු බව නිරීක්ෂණය විය. | අසාර්ථක විය. | |
| (ආ) | පොල්පිතිගම නගරයේ ඉදිකර සභාව වෙත 2021 ජූලි 26 දින පවරා දී තිබූ රු.21,140,000 ක වටිනාකමින් යුතු බස් නැවතුම්පල තුළ කිසිදු බස් රථයක් නවතා තැබීමක් සිදුකර නොතිබුණි. මෙම බස් නැවතුම්පල පිහිටා ඇති ස්ථානය අනුව ඉදිරියේදීත් බස් රථ තුළින් එවැනි ආදායමක් ඉපයිය හැකි තත්ත්වයක් දක්නට ලැබිය හැකිව නොතිබියදී එකක් රු.330 බැගින් බිල්පොත් 10 ක් මුද්‍රණය සඳහා ඇණවුම් ලබා දී තිබුණි. | 2021 ජූලි 26 දින ජනතා අයිතියට පත් කරනු ලැබූ බස් නැවතුම්පොල සම්බන්ධ කටයුතු ආරම්භ කිරීම සඳහා අදාළ ආයතන සමඟ සාකච්ඡා කිරීමෙන් පසු බස් නැවතුම්පල සම්බන්ධ කටයුතු ආරම්භ කිරීමට එකඟ වූ හෙයින් බස් රථ වලින් මුදල් අය කිරීම සඳහා බිල්පත් මුද්‍රණය කිරීමට කටයුතු කරන ලදි. | බස්නැවතුම්පල ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුවේ. |

**3.2 ප්‍රසම්පාදනය**

------------------

**3.2.1 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

--------------------------------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| --------------------------- | ------------------------ | ------------------- |
| පොල්පිතිගම මහජන ක්‍රීඩාංගණය අළුත්වැඩියාව සඳහා රු.4,794,393 ක මුදලකට කොන්ත්‍රාත්කරුවෙකු සමඟ ගිවිසුම් අත්සන් කර වැඩ නිමකර තිබුණ අතර එම ක්‍රීඩා පිටිය වටා මීටර් 320 ක් දිග කාණුවක් සකස් කර ඇති නමුත් මීටර් 100ක පමණ ප්‍රමාණයක් නිමකර නොතිබීම හේතුවෙන් කාණුවේ එක් කොටසක ජලය රැඳී තිබුණි. එසේම වැඩ විෂයය අංක 04 අනුව බොරළු ඇතිරීම ඝන මීටර් 636.99 ක් ලෙස දක්වා තිබුණද, භෞතික පරීක්ෂාවේදී එය ඝන මීටර් 559.99ක් වීමෙන් ඝන මීටර් 80 ක බොරළු ඇතිරීමේ අඩුවක් නිරීක්ෂණය වූ බැවින් ඝනමීටරයකට රු.1,100ක් බැගින් බොරළු ඝන මීටර් 80 ක් සඳහා රු.88,000ක් වැඩිපුර ගෙවා තිබුණි. රු.4,794,393 ක් වියදම් දරා සංවර්ධනය කර තිබුණද, සමාලෝචිත වර්ෂයේදී මෙම ක්‍රීඩාංගනය කුලියට දීම තුළින් කිසිදු ආදායමක් ලැබී නොතිබුණු අතර වාර්ෂිකව ක්‍රීඩා තරඟ ඇතුළු කටයුතු සඳහා භාවිතා වන වාර ගණන අවම මට්ටමක පැවති බැවින් ක්‍රීඩාංගනය සංවර්ධනය තුළින් ලබා ගත හැකි ප්‍රතිලාභයද අවම වී තිබුණි. | සත්‍ය ලෙසට සපයන ලද බොරළු ප්‍රමාණයම අතුරන ලදි. නමුත් ඇතුරුම් මිනුම් වෙනසක් ඇති වී ඇති නිසා මෙම කර්මාන්තය සඳහා දැනට අවසන් ගෙවීමක් සිදු කර නොමැති බැවින් අවසන් ගෙවීම සිදු කිරීමට පෙර ඇතුරුම් මිනුම් වල සඳහන් පරිදි අඩුපාඩු සඳහා බොරළු ඇතිරීමට කටයුතු කරන බව දන්වමි. | වැඩිපුර ගෙවීම් ආපසු අයකරගත යුතු වේ. |